# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2135/19 - 2019 අගෝස්තු මස 05 වැනි සඳුදා - 2019.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 6/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත**

6 වන වගන්ති යටතේ වූ නියමය

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය අර්ජුන රණතුංග වන මා විසින් සිවිල් ගුවන් සේවා අධිකාරිය විමසා, මෙම නියමය මගින්, 2013 පෙබරවාරි මස 15 වැනි දින අංක 1797/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව, 2016 ජූලි මස 01 වැනි දින අංක 1973/77 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් සංශෝධිත පරිදි වූ, සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියමයේ II වන උපලේඛනය එහි I වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''1. (i) බස්නාහිර පළාතේ කොළඹ පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ;
(ii) දකුණු පළාතේ පිහිටි මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ ;
(iii) බස්නාහිර පළාතේ රත්මලාන පිහිටි කොළඹ ගුවන් තොටුපළ ;
(iv) නැගෙනහිර පළාතේ පිහිටි මඩකලපුව ගුවන් තොටුපළ ; සහ
(v) උතුරු පළාතේ පිහිටි පලාලි ගුවන් තොටුපළ ;

සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.''.

අර්ජුන රණතුංග,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2019 අගෝස්තු 05 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

08 - 745


1A - PG 4607— 517 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*